ජගත් ජේ එදිරිසිංහ

# කාමු

12

මේ සිනමා නිර්මාණය කෙතරම් අභව්‍ය දැයි දවසේ පෙළ ගස්වා ඇති දර්ශන කීපය නැවත වතාවක් කියවා බැලූ නිරාශාට සිතුණි. ඉතිහාස පොතෙන් එහෙන් මෙහෙන් අහුලාගත් කතා කීපයක් ජන ප්‍රවාද කීපයක් සමගින් එකට ගැට ගසා සාදාගෙන තිබූ කතාව පවා තර්කානුකූල නැති බව ඇයට තේරුම් ගියේ පළමු වතාවට තිරනාටකය කියැවූ දිනයේදීම ය. සිනමා රස වින්දනය පිළිබඳ හසරක් නැති ප්‍රේක්ෂකයන්ගේ සාක්කුවට විදින්නට අමුනාගත් මේ කතාවද කුමාර ගේ කලින් සිනමා නිර්මාණ සේම අගනා රන් පැහැ කොළයක දැවටූ මැටි ගුලියක් පමණක්ය යන්න තේරුම් ගන්නට හැකි අය සිටින්නේ කීයෙන් කී දෙනෙක්ද යන්න අදත් නිරාශාගේ සිතට වද දෙන පැනයක්ව ඇත.

"මේ කාලෙදි මිනිස්සුන්ට හොඳටම විකුණන්න පුලුවන් හොඳම වට්ටෝරුව කුමාර අල්ලගෙන ඉන්නෙ.. ඒක මිනිහගෙ දක්ෂකම.... හැකියාව.. ඒ අතින් මිනිහට ගහන්ඩ කෙනෙක් මේ ෆීල්ඩ් එකේ නැහැ.." ඉසුඹුවක් ලද මොහොතක අතුල ධනංජය නිරාශාට කීවේ වටපිට කිසිවකු නැති බව සැක හැරගත් පසුවය. කැමරා ශිල්පියකු ලෙස උසස් සිනමා නිර්මාණ රැසකට සම්බන්ධව සිටි අතුලට මේ ක්ෂේත්‍රය පිළිබඳ ඇති හසල දැනුම නිරාශා දැන සිටියාය. අතුලට ඇහුම් කන්දුන්නේ එනිසා ය.

".. පතිරාජ මහත්තයල, ඕබේසේකර මහත්තයල, ධර්මසිරි අයියල දැන් ෆීල්ඩ් එකෙන් අයින් වෙලා ඉන්න එක මෙයාලට ගජ වාසියක්.. හඳගමත් හීලෑ වෙලා ළමා හුරතලය විකුණන තැනට වැටුණානෙ.... අනික් අතින් විදුල පවා දැන් නිෂ්ශබ්දයිනෙ.. මිනිසුන්ව මායා හීන ලෝකවල හිරකරළා ඉහ ඉණ අතගාගන්න ව්‍යාපාරයක් වෙලා මේක.." අතුල කතාව මොහොතකට නවතා වටපිට බැලුවේ ය. "...හැත්තෑව අසූව දශකයෙ ලස්සනට ගොඩ නැගීගෙන ආව සිනමා රසවින්දනය දැන් මොට වෙලා තියෙන්නෙ මේ අයියලට පින් සිද්දවෙන්න තමයි.. දරුවෙක්ගෙ හුරතල් කමයි දේශප්‍රේමයයි ඉතිහාසයයි පත අට එකට හින්දලා දුන්නම ඒක සිනමාව කියලනෙ හැමෝම හිතන්නෙ.. එහෙම හිතන්න තමයි මේ අය මේ රටේ මහජනතාවට කියාදෙන්නෙ.... මේ වට්ටෝරුවෙන් ඕනෙම වැහිල තියෙන සාක්කුවකට තට්ටු කරන්න පුලුවන් කියලා මෙයාල දන්නවා නිරාශා.. ඉතින් මිනිස්සු සිනමාවයි කියලා හිතාගෙන අර අපි ඉස්සර බලපු වෙසක් නාට්‍ය දිහා ලබාගෙන ඉන්නවා"



සියල්ල සැබෑය. විදුල නම් වන ඇසූ පිරූ තැන් ඇති සිනමාවේදියාගේ ඇසුරේ වැඩුණ තමාගේ සිනමා දැනුමට මේ සියල්ල වටහා ගත හැකි වුවද බහුතරය සිටින්නේ මුළාවක බව තේරුම් ගන්නට ඒ හැටි අපහසුවක් නැත. ඒ බව වඩාත් තහවුරු වන්නේ සවස රූ ගතකිරීම් වලින් අනතුරුව ඇය හෝටලයට ඇරලවන්නට ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වූ හසන්ත ඇලදෙණිය ඒ එන අතරේ කියූ දේ අසා සිටීමෙන්ය.

"කුමාර කියන්නෙ අදහන්න වටින මිනිහෙක්.. හරිම දක්ෂයෙක්" හසන්ත කීවේ සුඛෝපභෝගී රථයේ තැටි වාදන යන්ත්‍රයේ හඬ අඩු කරන අතරදීය. " ..මේ වැඩේට අත දාන්න කියල ලොක්ක කිව්වම මම ඒ හැටි හිතේ කැමැත්තෙන් නෙවෙයි එකඟ වුණේ.. ෆිල්ම්ස් හදන්න මගේ අදහසක් තිබ්බෙම නෑ.. ලොක්ක කිව්වම බෑ කියන්න බැහැනෙ.. ලොක්ක අමනාප කර ගත්තොත් අපේ බිස්නස් වලට පාඩුවෙයි... මිනිහා හිනාවෙලා හිටියට නයා වගේ පලිගන්නවා.. ඔයාලත් අහල ඇතිනෙ.. ඒකයි කැමති වුණේ.. ඒත් දැන්නං මම ගත්ත තීරණය ගැන සතුටුයි.. කුමාරට මේ වැඩේ ගැන තියෙන්නෙ පුදුම දැනුමක්නෙ.. මිනිහට සිනමාව ගැන විතරක් නෙවෙයි ඉතිහාසෙ ගැනත් පුදුම දැනුමක් තියෙනවනෙ"

නිරාශා අදහසක් ප්‍රකාශ නොකර අසා සිටියා ය. හසන්ත කතා කරන්නේ ඉදිරිය බලාගත්වනමය. වාහනය පුරා පැතිරෙන්නේ මිල අධික විලවුන් සුවඳකි.

".. මේ වැඩේට අත ගැහුවට පස්සෙ තමයි මං මේ ඉතිහාසෙ ගැන ටිකක් හරි දැනගත්තෙ .. අපි ඉතින් ඉස්කෝලෙ කාලෙ හරියට ඕව ඉගෙනගත්ත එකක්යැ.. ගිය සුමානෙ මං කුමාර කලින් හදපු ෆිල්ම්ස් දෙකකුත් බැලුව.. ෆැන්ටාස්ටික්.. අපේ හිස්ට්‍රි එක මේ තරම් ඉන්ටරෙස්ටින් කියල මට කලින් දැනිල තිබුණෙම නැහැ නිරාශා"

කුමාර මේ රූපගතකරමින් සිටින කතාවේ ඇත්තේ විකෘති කරන ලද ඉතිහාසයකැයි කියන්නට සිතුණද මුනිවත රැකීමට නිරාශා සිතා ගත්තා ය. හසන්ත කෙබඳු පුද්ගලයකුද යන්න හෝ ඔහු හා කුමාර අතර ඇති සබඳතාව කෙබඳු එකක්ද යන්න හෝ නොදැන අදහස් ප්‍රකාශ කිරීම නුවණැති ක්‍රියාවක් නොවේ. හිත හදාගෙන යන්නට පටන්ගත් ගමනට අවහිරවන යමක් ප්‍රකාශ කර සියල්ල නැවත අවුල් කරගන්නට අවශ්‍ය නැත.

".. මම ඉස්සර දවසක යාලුවෙක් එක්ක සිංහල ෆිල්ම් එකක් බැලුවා.. යාලුවගෙ බලකිරීමටමයි ගියේ.. එදායින් එදා මං ආයෙම කවදාවත් සිංහල ෆිල්ම්ස් බැලුවෙ නෑ.. හරිම බෝරිං.. ජීවිතේ ප්‍රශ්න මැද්දට ෆිල්ම් එකක් බලල තවත් ප්‍රශ්න ටිකක් එකතු කරගන්නෙ මොකටද නිරාශා.. ප්‍රශ්න වල බරට ඔලු පාත් කරගෙන ඉන්න මිනිස්සු නෙවෙයි අපි දකින්න ඕනෙ.. අපි දකින්න ඕනෙ සතුටින් ඔලුව උස්සගෙන ඉන්න මිනිස්සු... නැද්ද මං අහන්නෙ..?" ඔහු උත්සාහ කරන්නේ තමාව ද කතාවට ඇද ගන්නට බව නිරාශාට දැනෙයි. හසන්ත ගේ මේ මුග්ධ ප්‍රකාශ හමුවේ තව දුරටත් මුණිවත රැකීමට සිත ඉඩ නොදෙයි.

"එක එක අයගෙ රස වින්දනය වෙනස්නෙ මිස්ටර් ඇලදෙණිය.. අනෙක් අතින් හීන ලෝකවල මිනිස්සු අතරමං කරලා ඒ මිනිස්සුන්ගෙ හිතේ ඇති කරන සතුට කෘතිමයි කියල තේරෙන්නෙ නැද්ද.. ඒක මායාවක්.. බොරුවක්.. යථාර්ථය හංගන්න බැහැ හසන්ත.. මිනිස්සු විඳින දුක්වේදනා මේ සමාජ ක්‍රමයේ වරදක්.. සිනමාකාරයා ඒක වහන්න හදනව නම් ඒක මහ මුලාවක්.. ප්‍රෝඩාවක්.. පාලකයන්ගේ ජන පීඩක පාලනය කරදරයක් නැතුව ඉස්සරහට ගෙනියන්න දෙන අනියම් සහයෝගයක් ඒක" නිරාශා කියන්නේ තව දුරටත් නිහඬව සිටීම අඥාන කමකැයි හැඟුණ බැවිනි. ".. යථාර්ථය හංගන හැම නිර්මාණයක්ම හරිම ව්‍යාජයි."

හසන්ත ඇය දෙස හැරී බැලුවේ ය. ඔහු නිරාශා වෙතින් බලාපොරොත්තු වූයේ එවන් දැඩි පිළිතුරක් නොවේ.

"නිළියන් යනු සුරතල් සත්ව කොට්ඨාශයකි.. හමුවූ විට දොඩන තොඳොල් බසත් නිදි යහනේදී කෙඳිරි ගෑමත් හැරෙන්නට සමාජ සාධාරණය ගැන හෝ ජනතා පීඩනය ගැන හෝ වෙනත් එවැනි බැරෑරුම් මාතෘකාවක් පිළිබඳව හෝ යමක් ඒ සත්ව කොට්ඨාශය කිසි දිනෙක තෙපළන්නේ නැත" ඒ හසන්ත ඇළදෙණිය ගේ පොතේ මේ තාක් කාලයක් ලියැවී තිබුණ හැටිය. ඒ පොත ඉරා දැමීමට දැන් කාලය එළැඹ ඇති බව ඔහුට වැටහෙයි.

"මට අමතක වුණානෙ.." ඔහු කීවේ ය.

"මොකද්ද?" ඈ ඇසුවාය.

"මං මේ කතා කරන්නෙ සම්භාව්‍ය චිත්‍රපට අධ්‍යක්ෂවරයකුගෙ වයිෆ් එක්ක කියලා.."

සිනාවක් වැනි යමක් ඇගේ මුවේ ඇඳී අතුරුදන්ව යනු ඉදිරිය බලාගෙන රිය පදවමින් සිටි හසන්ත නොදුටුවේය. ඔහු ඉදිරියෙන් පැමිණෙමින් තිබූ බසයකට ඉඩ දෙනු වස් සිය කාරය පාර අයිනට ගනිමින් සිටියේ ය. වේවැල් කූඩා හිස තබා ගත්, කුඩු වැස්සෙන් තෙමුණ සිරුරු ඇති ගැහැනුන් කීපදෙනකු පාර අද්දර සිට බලා සිටිනු නිරාශා දුටුවා ය. සිහින් මිහිදුම් පටලයක් පහළ තැනිතලාවේ සිට ඉහළට නැගෙමින් තිබුණි.

"මේ ෆිල්ම් එකෙන් පස්සෙ කුමාරගෙ ඊළඟ එකත් ප්‍රොඩියුස් කරන්න මං හිතුවා නිරාශා.." බොහෝ වේලාවකට පසු හසන්ත කීවේ ය.

එය පුදුමයට පත්විය යුතු තීරණයක් නොවන බව නිරාශා දැන සිටියා ය. හසන්ත වැනි පළපුරුදු ව්‍යාපාරිකයකු කුමාර වැනි සාර්ථක අධ්‍යක්ෂවරයකු ලෙහෙසියෙන් අතනොහරිනු ඇත. කුමාර මේ හාරමින් සිටින්නේ ධන උල්පත් ය. ඒ වෙනුවෙන් කුමාරගේ දෑත් සවිමත් කරන්නට හසන්ත දෙවරක් නොසිතනු ඇති බව නිසැකය.

"ආදායම නිසා නෙවෙයි.. මං මේ වැඩෙන් සතුටක් ලබනවා.. ඒකයි... " හසන්ත නැවත කීවේ නිරාශාගේ සිත කියැවූවාක් මෙනි. ඇය දෙස හැරී බැලූ ඔහුට මෙවර ඇගේ මුවේ ඇඳුන සිනාව මගහැරී නොගියේ ය.

"මං සල්ලි පස්සෙම දුවන මිනිහෙක් නෙවෙයි නිරාශා.." ඔහු ඌණ පූරනයක් කළේ ය. නිරාශා පිළිතුරු ලෙස යමක් කියනු ඇතැයි ඔහු මඳ වේලාවක් බලා සිටියේය.

"..මගේ ඊළඟ ෆිල්ම් එකටත් ඔයා එකතුවෙන්න ඕනෙ.." ඇය නිහඬව සිටිද්දී ඔහු කීවේ ය. ".. මං කැමතියි ඔයා වගේ බුද්ධිමත් අය එකක් වැඩ කරන්න.. සීනිබෝල වගේ අය මට පෙන්නන්න බැහැ.."

0000

අන්ධකාරය මකා දමන්නට අසාර්ථක උත්සාහයක් දරමින් මළානික වීදි පහන් දැල්වෙන්නට පටන් ගෙන ඇත. ගාලුමුවදොර පිටියේ කෑම කඩ අසළ සෙනඟ පිරෙනු විදුලට පෙනෙයි. තෙත බරිත මුහුදු සුළං වාහනයේ විවෘත කවුලු තුළින් ඇදී විත් ඔහුගේ මුහුණ මත පතිත වෙයි. එය පීඩාවකි. වීදුරු සියල්ල ඔසවා සුළඟ වැළැක්වූ විදුල ආසනය පහත් කර ඇළවී දෑස් පියා ගත්තේ ය.

දහවල සමදරා ගේ කාර්යාලයෙන් පිටවූ වේලාවේ සිට ඔහු සිටියේ කැළඹුණ සිතිනි. ආත්මාර්ථය උදෙසා .අපතයකු. වන්නට සිදුවීම දරා ගත නොහැකි තරම් සිතට වද දෙයි. ජීවිතයේ පළමු වතාවට ප්‍රතිපත්තියක් පාවාදීමට සිදුවී ඇතැයි යන්න දැනෙන විට තමා පිළිබඳවම උපන් කෝපයක් ඔහු සිත වෙළා ගනියි. දරා සිටිය නොහැකි තරමේ අපුලකින් හිස ගිනි ගනියි.

ස්වයං සංවාදයකින් සිත සනසා ගන්නට කෙතරම් උත්සාහ කළද කිසියම් වරදකාරී හැඟීමක් පණ ගසමින් නැගී සිටියි. තමා මේ පියවර ගන්නේ යහපත් අරමුණක් වෙනුවෙන් නොවේදැයි නැවත නැවතත් සිතන්නට ඔහු උත්සාහ කළේ තියුණු තුඩකින් ආත්මය සිදුරු කරමින් සිටින ඒ ප්‍රාණියා නසා දැමීමේ අරමුණින්මය.

මහ පොළොවේ සාරය ආත්මාර්ථකාමී ලෙස උරා බොමින් මල් ඵල නොදරන විසල් රුකක් ලෙස නැගී සිටීමේ තේරුමක් නැත. මහ පොළොවෙන් ලබා ගත් සාරය වෙනුවෙන් යමක් දායාද කිරීමේ පරම යුතුකමක් ගසකට ඇත.

දෑත් අකුළා බලා සිටිනවාට වඩා යමක් කිරීමට උත්සාහ දැරිය යුතුමය. සමදරා ගේ ව්‍යාපෘතිය හරහා ලැබෙන ශක්තිය ඒ සඳහා හොඳටම ප්‍රමාණවත් ය.